**මොනරාගල ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සභාව විසින් රැස් කරන ලද ආපසු නොගෙවන කඩ කාමර මූලික තැන්පත් මුදල් රු. 5,443,933 ක් පොදු තැන්පතු ගිණුමට ඇතුලත් කර තිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල කඩ කාමර මූලික තැන්පත් මුදල රු. 9,250,000 ක් වුවත් එය ටෙන්ඩර් කඩ කුලී ආදායම් ගිණුමට රු. 23,109,706 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදී සිදු නොවීමට අදාල විෂය නිලධාරීන් දැනුවත් කළෙමි. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ඉදල් ඉතිරි තොගයේ වටිනාකම රු. 11,480 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 93,480 ක් ලෙස දක්වා තිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදී සිදුනොවීමට අදාල විෂය නිලධාරීන් දැනුවත් කළෙමි. | නිවැරදිව තොග වටිනාකම් ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල ලෙස රු. 2,552,912 ක් දක්වා තිබුණද, බස් නැවතුම්පල ඉදිකිරීම හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා ලබාදී තිබුණු ණය මුදලින් තව දුරටත් පියවා නොමැති මුදල රු.65,291,000 ක් වූයෙන් අදාල ණය ශේෂය රු.62,738,088 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම ශේෂය තහවුරු කිරිම සඳහා කිසිඳු උපලේඛනයක් හෝ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ අතර නාගරික සංවර්ධන අධිකාරියෙන්ද එම ශේෂයන් පිළිබඳ ලිඛිත තහවුරුවක් ලබාගත නොහැකි විය. ඉදිරියේදී ශේෂය තහවුරු කර ගැනීමෙන් පසු මේ සම්බන්ධව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයේ වැඩ නිමකරන ලද රු.18,039,097 ක් වටිනා කර්මාන්ත 11 ක වටිනාකම දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද දේපලවල වටිනාකම් ප්‍රාග්ධනිත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රාදේශීය සංවර්ධන සභයක ව්‍යාපෘතිය යටතේ ලැබුණු ප්‍රාග්ධන ආධාර රු. 27,801,385 ක් සහ ප්‍රාග්ධන ගෙවීම් රු. 22,100,654 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදී සිදුනොවීමට අදාල විෂය නිලධාරීන් දැනුවත් කළෙමි. | සමාලෝචිත වර්ෂයට අදාල සියලුම ආදායම් වියදම් ගිණුම්ගත කල යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සතිපොල බදුදීම වෙනුවෙන් ලැබිය යුතු හිඟ මුදල රු. 7,634,289 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 6,727,204 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව දන්වා සිටිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඌ) | ප්‍රාදේශීය සභාව විසින් බාහිර පාර්ශවයකට එරෙහිව පවරා ඇති නඩුවක් හා බාහිර පාර්ශවයන් විසින් සභාවට විරුද්ධව පවරා ඇති නඩු 06 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කිරීම් සම්බන්ධව කටයුතු කිරීමට අදාල විෂය නිලධාරීන් දැනුවත් කළෙමි. | මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව්කිරීම් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ජල ගාස්තු සහ හිඟ කඩකුලී ශේෂය ඒ සඳහා ලබාදී ඇති ලේඛන සහ උපලේඛනවල දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී රු.98,750 ක වෙනසක් විය. | ලේඛන තුලනය කිරීමේ දෝෂයකි. එය ඉදිරියේදී නිවැරදි කරමි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොසැසඳීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 1,242,047,851 ක් වූ වත්කම් විෂයයන් 04 ක් සහ වගකීම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන සහ ශේෂ සනාථන ලිපි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සභාවට අයත් ඉඩම් තක්සේරු කර නිරවුල් කර ගැනීමටත් අනෙකුත් ලේඛන සහ උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1) (අ) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 454ක් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | මාර්ග සියල්ල ගැසට් කිරිම සඳහා මෙ වන විට සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්ථනය කර ඇත. | මාර්ග ඉන්වෙන්ට්‍රිය ඇතුළත් මාර්ග ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |
| (ආ) | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 2881 ක් සවිකර තිබුණද,වීථිආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම් ගත නොවීමට බලපාන කරුණු රාශියක් පවතින අතර අවශ්‍ය වුවහොත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරමි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,924,624 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,843,956 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 13,045,000 | 13,586,447 | 6,653,012 | 6,933,435 | 13,075,800 | 13,677,904 | 6,833,377 | 6,844,527 |
| (ii) කුලී | 19,427,450 | 43,694,679 | 24,958,554 | 18,736,125 | 33,602,500 | 18,532,148 | 9,950,256 | 8,581,892 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,770,100 | 1,641,262 | 1,641,262 | - | 1,430,100 | 1,622,408 | 1,622,408 | - |
| (iv) වෙනත් ආදායම් | 30,255,275 | 24,061,822 | 17,250,585 | 6,811,237 | 21,151,355 | 29,460,025 | 18,100,480 | 11,359,545 |
| එකතුව | 64,497,825 | 82,984,210 | 50,503,413 | 32,480,797 | 69,259,755 | 63,292,485 | 36,506,521 | 26,785,964 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.82,984,211 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 32,480,798 ක් අයකරගෙන නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 39 ක් විය. | ආදායමෙන් කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති හිඟ මෙහි ඇතුලත්ව ඇත. රජයේ දේපලවලින් සහ රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ සම්බන්ධව අදාල ආයතන ඉල්ලීම් කර ඇති අතර හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | බිල් කල ආදායම් රැස් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 13,586,448 ක් වූ වරිපනම් බදු ආදායමින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 7,315,384ක් වූ අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 54 ක් විය. | හිඟයෙන් වැඩි වටිනාකමක් රජයේ දේපලවලින් වන අතර කඩිනමින් හිඟ අයකර ගැනීමට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වමි. | බිල් කල ආදායම් රැස් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේදී පැවති රු. 10,500,880 ක් වූ හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. 8,784,462 ක හිඟ බදු ආදායමක් තව දුරටත් අයකරගත යුතුව පැවතුණි. ඒ අනුව හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායම අයවීමේ ප්‍රතිශතය සියයට 16 ක තරම් අඩු ප්‍රතිශතයක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට අදාල ක්‍රියාමාර්ගයන් ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි . | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 145 කින් අයවිය යුතු රු.8,945,904 ක් වූ කඩ කාමර බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලි රු.3,375,675 ක් අයකරගත යුතුව පැවතුණි. එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 38 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. | බිල් කල ආදායම් රැස් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවති රු. 4,413,634 ක හිඟ කඩ කුලී ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු. 1,144,593 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. | හිඟ කඩ කුලී කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු. 2,574,461ක් සහ මුද්දර ගාස්තු රු. 12,380,810 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ හිඟ මුදල් ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් තුමා වෙතින් දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය.. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 129,580 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අදාල පාර්ශවයන් මේ වන විට මිය ගොස් ඇති අතර,ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට මියගිය අයවලුන්ගේ මරණ සහතිකපත් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කොට ඇති බව කාරුණිකව දන්වමි. | කඩිනමින් අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවසන්වරට 2010 හා 2011 වර්ෂයේදී දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණද, වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශය පුළුල් කර ගැනීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | වරිපනම් සීමාව තුළ කරනු ලබන නව ඉදිකිරීම් තාවකාලික තක්සේරුවකට ලක්වන අතර 2021,වර්ෂයේ දී දියුණු කළ ප්‍රදේශයක් ලෙස හඳුනාගත් දොඩම්වත්ත ප්‍රදේශය ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. | දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකල යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පොළේ පිහිටි කඩ කාමර 59 කින් රු. 4,135 සිට රු. 7,700 දක්වා කඩ කාමර කුලී අයකරමින් පැවතිණි. එම කඩකාමර කුලිය තීරණය කිරීමට අදාලව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණු අතර අයකරමින් පැවති කුලිය තීරණය කළ ආකාරය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම මුදල තාවකාලික තක්සේරුවක් පදනම් කරගෙන අය කරන බවත්, ඉදිරියේ දී තක්සේරු දෙපාරතමේන්තුව මඟින් විධමත් තක්සේරුවක් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් දන්වමි. | කඩ කාමර කුලී අයකිරීමේ දී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරන ලද වටිනාකම අයකළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් ලෙස සභාවේ ලේඛනවල දැක්වෙන ඉඩම් සහ සුසාන භූමි 68 ක් ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණු අතර ඉඩම් 54 ක් මැනුම්කර නොතිබුණි. | මේ වන විට ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 10 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 17 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිලිබද සෑම මාසයක් අවසානයේම පලාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කරන බව දන්වා සිටිමි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුය. |
| (ආ) | සභාවේ සේවය කළ නිලධාරීන් හා සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.225,823 ක සේවක ණය අයකරගෙන නොතිබුණු අතර සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 19,561 ක ණය ශේෂයට අදාල හිඟ කාල පරිච්ඡේදය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලන

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 3 සිට සියයට 99 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි . | යම් යම් අවස්ථා වල ගනුලබන සාධනීය තීන්දු තීරණ හා ආදායම් අයකිරීමේ විවිධ ක්‍රමෝපායන් මත ඇස්තමේන්තුගත ආදායමට සරිලන මුදලක් අයකර ගැනීමට නොහැකි වූ අවස්ථාද විය.මහජන සේවය සැලසීමේදි අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු හා කාලීන වශයෙන් මැදිහත්විය යුතු කරුණු පදනම්කරගත් පසු විවිධ වැය ශීර්ෂයන්ගේ විචලනයන් සිදුවන බවද කාරුණිකව සඳහන් කරමි. | අයවැය ලේඛනය නිවැරදිව පිළියෙල කර එහි සඳහන් ඉලක්ක සපුරාගත යුතුය. |